# උතුම් ගුණදම්



වෙනුක්ෂි රමේෂා ගුණරත්න

# පිදුම

**මා හට සිප් සතර කියා දුන් ගුරු මව්පියන්ට මාගේ යහළු යෙහෙළියන්ට සහ සියලු ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට බැතිබර සිතින් පිළිගන්වමි.**

# ස්තූතිය

**මෙම පොත ලිවීමට මා හට උදව් කළ සියලු දෙනාට ස්තූතියි.**

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයේ ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන් පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලයක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන් කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් දිවිය දිනන විද්‍යුත් පොතක් ව ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවනට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසලේ දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප විසින් සංවිධානය කළ දිවි දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගතයට දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදී ශිෂ්‍යාවන් සෙසු පාසල්වල දරුවන් යොමු කළ ස්තූතිය මෙමගින් පිරි නමමි.

ශෂිකා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය
2023-11-01

පොසොන් පෝය ළඟ ළඟ එනවා.
ඒ වෙනුවෙන් පන්සලේ පැවැත්වීමට
නියමිත බැති ගී ප්‍රසංගය බැති ගී පුහුණුවට
මාද පන්සලට ගියා.
බැති ගී පුහුණුවන අවස්ථාවේ සෑම
දවසකම වාගේ මලිති නංගී පන්සලක සිටින
බව නොදැන මෙන් ඒ මේ අත දුවමින්
අන් අයට හිංසා කලා. ඒ හැසිරීම මට
මහත් කරදරයක් වුණා.



බැති ගී පුහුණුව පටන් ගත්තා මලිති
නංගී මා අසලම සිට ගෙන ගී කියන්න
පටන් ගත්තා.

මල් සුගන්දේ, දම් සුගන්දේ
සිල් සුළං රැල් පාවෙලා........//



ගීතය තාලයට ගයමින්, කවිඳු අයියා, සදෙව් අයියා, ගුවණිකා, චනුරි නංගී, ශේන් අයියා සහ තවත් අක්කලා, අයියලා, නංගී හැමෝම ගී පුහුණු වෙමින් සිටියා. එහෙත් මලිති නංගීගේ හැසිරීම් වෙනස් වුණේ නැහැ.

ඇය අන් අයට වදයක් වන සේ හැප්පෙමින් ගහමින් හැසිරුණා මා එයාට අවවාද කළා නංගී ඔහොම කරන්න එපා. එය කරදරයක් ඇය එක කනකටවත් ගත් බවක් දැනුණේ නැහැ.

ඇයගේ හැසිරීමට බැන බැන සිටියා.
ඒ කිසිවක් ඇයවත් ඇගේ අම්මාවත්
කරදරයක් එය නොහැඟෙන සේ සිටියා.

ඇය මට වැරෙන් පහර කිහිපයක් ගැහුවා.
මා එපා යැයි කියා අවවාද කළා. බැති ගී
පුහුණුව අවසන්ව එන අතර මට අහල පහල
නැන්දලා අත්තම්මලා මට බැන්නා ඇයි ඒ ළමයා
ගහනකල් හිටියේ ගහන්නය තිබුණේ........?
ඒත් දිගින් දිගටම මගෙන් හැමෝම මී
ප්‍රශ්නය ඇසුවා.



නිහඬබව බිඳ එයා එහෙම හැසිරුණාට
මම එසේ කිරීමට කැමති නෑ. එයා කරන දේවල් වලට මම ගැසුවොත් බැන්නොත් මටත් ඔය විදිහට බනිවී. මගේ අම්මටයි, තාත්තාටයි බනිවී.
මාත් ඈය මෙන් නරක ළමයෙක් සේ සිතාවී.
මගේ අම්මා තාත්තා කියා දුන් උතුම් ගුණ දම් රැකිය යුතුයි.
එවන් ළමයෙකු සමඟ ගැටීම මා මටම කරගන්නා ලැජ්ජාවකි.
මා කියවන් යද්දි මගෙන් ප්‍රශ්න කළ නැන්දලා මාමලාට ලැජ්ජාවක් දැනුණා සේ බිම බලා ගත්තා.



සිතට ගන්න..........
අපයම් තැනකට ගියෙද ඒ තැන අනුව හැසිරිය යුතුය...........
අප සැදූ මව පියාට සතුටක් වන සේ
ආදර්ශමත් වෙමු. උතුම් ගුණ දම් පිරි ළමයෙක් වෙමු.

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොතපතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිව යුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කුරු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
2023-11-01